ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2017 ජුනි 30 |

## ලියාපදිංචි බැංකු විසින් ඔරොත්තුදීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා බාසල් III ප්‍රමිතීන් ක්‍රියාවට නැංවීම

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2016 වසර අවසානයේ නිකුත් කරන ලද අවම ප්‍රාග්ධන ප්‍රමිතීන් පිළිබඳ විධානයන් අනුව 2017 ජූලි 01 වැනි දින සිට ලියාපදිංචි බැංකු අවම ප්‍රාග්ධන ප්‍රමිතීන් ක්‍රියාවට නංවනු ඇත. මෙම විධානයන් බැංකු වල ඔරොත්තුදීමේ හැකියාව ඉහළ නැංවීමට අන්තර්ජාතික පියවීම් බැංකුව (BIS) නිකුත් කල බාසල් III තෝලනය සහ ද්‍රවශීලතාව පිළිබඳ මාර්ගෝපදේශනයන්ට අනුකූල වේ.

**බැංකුවල ප්‍රාග්ධනය ගුණාත්මකව සහ ප්‍රමාණාත්මකව ශක්තිමත් කිරීම**

අවම ප්‍රාග්ධන අවශ්‍යතාවලට අමතරව පහත පරිදි ප්‍රාග්ධන ස්වාරක්ෂක හඳුන්වාදීම තුළින් බැංකුවල ප්‍රාග්ධනය ගුණාත්මකව සහ ප්‍රමාණාත්මකව ශක්තිමත් කිරීමට බාසල් III ප්‍රාග්ධන ප්‍රමිතීන් උත්සාහ කරයි.

- යහපත් කාලසීමාවලදී ගොඩනංවා ආතතිමය කාලසීමාවලදී භාවිතයට ගැනීමට අපේක්ෂිත ප්‍රාග්ධන සංරක්ෂණ ස්වාරක්ෂකය (Capital Conservation Buffer).
- මූල්‍ය පද්ධතියේ ඇති විය හැකි සීඝ්‍ර ණය වර්ධන තත්ත්වයන්ට හා වත්කම් බුබුළු වලට මුහුණ දීමට ආර්ථික චක්‍රයට ප්‍රතිවිරුද්ධව ගොඩනැගිය යුතු ප්‍රාග්ධන ස්වාරක්ෂකය.
- පද්ධතිමය අවදානම වලක්වා ගැනීමට පද්ධතිමය වැදගත්කමක් ඇති බැංකුවලට ප්‍රාග්ධන ස්වාරක්ෂකයක් හඳුන්වාදීම.

**2019 ජනවාරි 01 වැනි දින සිට ඉහළ නංවන ලද ප්‍රාග්ධන අවශ්‍යතාවයන්**

ජාත්‍යන්තර කාලරාමුවට අනුකූලව 2019 ජනවාරි මස 01 වැනි දින වනවිට සම්පූර්ණ කළ යුතු සිය අවදානම මත බර තබන ලද වත්කම්වලට අනුකූල ඉහළ දැමූ බාසල් III ප්‍රාග්ධන අවශ්‍යතාවයන් ලියාපදිංචි බැංකු විසින් පහත පරිදි අදියරෙන් අදියර සම්පූර්ණ කරනු ඇත.

- දේශීය පද්ධතිමය වැදගත්කම් ඇති බැංකු ලෙස හඳුනාගත් රුපියල් බිලයන 500 ට වැඩි වත්කම් ඇති, බැංකු පද්ධතියෙන් 71% ක් නියෝජනය කරන බැංකු 06 ක් විසින් තම ප්‍රාග්ධන මට්ටම් වත්මන් 10% මට්ටමේ සිට 2019 ජනවාරි මස 01 වැනි දින වනවිට 14% දක්වා ඉහළ නැංවිය යුතු ය.
- රුපියල් බිලියන 500 ට අඩු ප්‍රාග්ධනයක් සහිත අනෙකුත් සියලුම බැංකු තම ප්‍රාග්ධන අනුපාත වත්මන් 10% මට්ටමේ සිට 12.5% දක්වා ඉහළ දැමීමට කටයුතු කරනු ඇත.

**ප්‍රමිතීන් ක්‍රියාවට නැංවීම සහ බැංකු ක්ෂේත්‍රයේ ඒ සඳහා වන සූදානම**

බාසල් III ද්‍රවශීලතා ප්‍රමිතීන් යටතේ නිකුත් කළ බැංකු පනත් විධානයට අනුව 2015 වසරේ දී බැංකු විසින් ද්‍රවශීලතා ආවරණ අනුපාත ක්‍රියාවට නැංවීම සිදුකරන ලදී.

බාසල් III නොලිහිල් රීතීන් හා අනුකූලවීම තහවුරු කරනු වස් බැංකුවල ප්‍රාග්ධන සැලසුම් ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කරන ලදී.

- රාජ්‍ය අංශයේ විශාල බැංකු සහ පෞද්ගලික අංශයේ බැංකු විසින් නව ප්‍රාග්ධනය යෙදවීම සහ රඳවා ගන්නා ලාභ ප්‍රමාණය වැඩි කිරීම මගින් ප්‍රාග්ධන මට්ටම ඉහළ දැමීමට කටයුතු කිරීම.
- කුඩා ප්‍රමාණයේ බැංකු ඒකාබද්ධවීම හරහා ඒවායේ ප්‍රාග්ධන මට්ටම් තවදුරටත් වර්ධනය වීම සහ ශේෂපත්‍ර වර්ධනය අපේක්ෂා කෙරේ.
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකුවල අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා ඇගයීම් ක්‍රියාවලිය අගයනු ලබන අතර, මෙහිදී බැංකුවල ප්‍රාග්ධන මට්ටම්, අවදානම් කළමනාකරණය, ව්‍යාපාර කටයුතු ව්‍යාප්ත කිරීම පිළිබඳව මධ්‍යකාලීන සැලසුම් මෙන්ම බාසල් III ප්‍රමිතීන් ක්‍රියාවට නැංවීම ද නිරීක්ෂණය කරනු ලබයි.
- බලපත්‍රලාභී බැංකු විසින් 2017 ජූලි 01 වැනි දින වනවිට පැවතිය යුතු ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලනු ලබන අතර ඉදිරියේදී තම ප්‍රාග්ධන මට්ටම් තවදුරටත් ඉහළ නැංවීමට කටයුතු කරනු ඇත. මෙමගින් මෙරට බැංකු ක්ෂේත්‍රයට තම ව්‍යාපාර පුළුල් කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් අඩු අවදානම් අධිකයක් යටතේ ලබාගැනීම හරහා ආර්ථිකයට ප්‍රතිලාභ ලබාදීමට හැකියාව ලැබෙනු ඇත.

**ඉදිරි ගමන**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉදිරියේදී අන්තර්ජාතික කාලරාමුවලට අනුකූලව බාසල් III තෝලන අනුපාතය සහ ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය පිළිබඳ ප්‍රමිතීන් සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීමට බලාපොරොත්තු වේ.